# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# <u>භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම</u>

## 2024 ජනවාරි 31 වැනි දින රුපියල් මිලියන 160,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ වෙන්දේසිය

භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| පරිණත කාලය | **දින 91** | **දින 182** | **දින 364** | **එකතුව** |
|---|---|---|---|---|
| සු.හ.ජා. අංකය (ISIN)* | LKA09124E033 | LKA18224H025 | LKA36425A310 | |
| වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුදල (රු.මිලි.) | 40,000 | 70,000 | 50,000 | 160,000 |

| | |
|---|---|
| වෙන්දේසි කරන දිනය | : 2024 ජනවාරි 31 වැනි දින |
| ගෙවීම් කළ යුතු දිනය | : 2024 පෙබරවාරි 02 වැනි දින |
| නිකුතුවේ දිනය | : 2024 පෙබරවාරි 02 වැනි දින |
| ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව | : 2024 ජනවාරි 31 වැනි බදාදා පෙ.ව. 11.00 |
| ලංසුවක් සඳහා අවම මුදල | : රුපියල් මිලියන පහක් (5,000,000/-) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (1,000,000/-) ගුණිතයන්ගෙනි. |

රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. ඉහත සඳහන් පරිදි ලංසුවක් සඳහා වන අවම මුදලට අනුගත වෙමින් අපේක්ෂිත ආයෝජකයන්ට (මහජනතාව හෝ වෙනත් ඕනෑම ආයෝජකයෙකුට) පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

**ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ලැයිස්තුව**

| | | | |
|---|---|---|---|
| ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ් | 2206297 | මහජන බැංකුව | 2206783 |
| ලංකා බැංකුව | 2541938 | සම්පත් බැන්ක් පී.එල්.සී. | 2305842 |
| කැපිටල් එලයන්ස් පී.එල්.සී. | 2317777 | සෙලාන් බැන්ක් පී.එල්.සී | 2456340 |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2332319 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් | 2675096 |
| එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 2425010 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී. | 2639883 |

වෙළෙඳපොල තත්ත්වයන් මත, මෙම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි, එක් එක් පරිණත කාලයන්ට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලැබිය හැකි ය.
අපේක්ෂිත ආයෝජකයන්ට ප්‍රාථමික අලෙවිකරුවන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ද්විතියික වෙළෙඳපොළෙන්ද භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත හැකිය.

* සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය


**<u>නිකුත් කරන කාර්යාලය</u>**
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01.
දුරකථන :+94 11 2477011 ෆැක්ස් :+94 11 2477687
www.cbsl.gov.lk

එන්. ඩී. වයි. සී. වීරසිංහ
රාජ්‍ය ණය අධිකාරී/ලේඛකාධිකාරී